ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ
අංක 2238/39 - 2021 ජූලි මස 30 වැනි සිකුරාදා - 2021.07.30
(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත

3(2) වගන්තිය යටතේ වූ නිවේදනය

සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3(2) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ආර්ථික ප්‍රතිපත්ති සහ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මා විසින් මෙම නිවේදනය මගින් පහත සඳහන් පරිදි ප්‍රකාශයට පත් කරමි; එනම්-

(1) නවීන පන්නයේ යාත්‍රා සඳහා ප්‍රමාණවත් බහාලුම් පාලන ධාරිතාවක් සහ ප්‍රමාණවත් ගැඹුරක් ලබාදීම මගින් කොළඹ වරායේ තත්ත්වය දකුණු ආසියානු කලාපය සඳහා වූ අන්තර් නැව්ගත කිරීම් කලාප මධ්‍යස්ථානයක් බවට ඒකාබද්ධ කිරීමේ ඉලක්කය සහිතව එ.ජ.ඩො. මිලියන 650 ක අපේක්ෂිත ආයෝජනයක් සමගින් කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය යටතේ වූ බටහිර බහාලුම් පර්යන්තය - 1 (මෙහි මින්මතු ''WCT - 1'' යනුවෙන් සඳහන් කරනු ලබන) ප්‍රවර්ධනය කිරීමේ සහ මෙහෙයවීමේ ව්‍යාපෘතිය ඉහත කී පනතේ කාර්යය සඳහා ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් වශයෙන් හඳුනා ගන්නා ලදී. එම්/එස් අදානි පෝර්ට්ස් ඇන්ඩ් ස්පෙෂල් ඉකොනොමික් සෝන් ලිමිටඩ් ඉන්දියා ආයතනය, ජෝන් කීල්ස් හෝල්ඩින්ස් පීඑල්සී සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමග එක්ව පෞද්ගලික රාජ්‍ය හවුල් ව්‍යාපාරයක් වශයෙන් අවුරුදු තිස්පහක (35) කාලසීමාවක් සඳහා ඉදිකර, ක්‍රියාත්මක කර, පැවරීමේ (මෙහි මින්මතු ''BOT'' යනුවෙන් සඳහන් කරනු ලබන) පදනම මත මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනා කර ඇත.

(2) තවද, පහත දැක්වෙන පරිදි ව්‍යාපෘතිය අදියර තුනකින් (03) ක්‍රියාත්මක කර වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කරනු ලබන බවට ද ප්‍රකාශයට පත් කර ඇත.

I වන අදියර
ව්‍යාපෘති සමාගම සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය අතර, BOT ගිවිසුම අත්සන් කරනු ලබන දිනයේ සිට ආරම්භව මාස තිස් හයක (36) කාලසීමාවක් ඇතුළත BOT ගිවිසුමේ නිශ්චිතව දක්වා ඇති අවශ්‍ය යටිතල පහසුකම් ද ඇතුළුව මීටර් 600ක ජැටි බැම්ම සහ පර්යන්ත භූමි ප්‍රදේශය ඉදිකිරීම සම්පූර්ණ කර මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීම.

1A - G 34815 — 45 (2021/08)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

II වන අදියර

BOT ගිවිසුමේ දින සිට ආරම්භව මාස හතළිස් අටක් (48) ඇතුළත BOT ගිවිසුමේ නිශ්චිතව දක්වා ඇති අවශ්‍ය යටිතල පහසුකම් ද ඇතුළුව මීටර් 1,400 ක සම්පූර්ණ දිග ප්‍රමාණයකින් යුත් ජැටි බැම්ම සම්පූර්ණ කර මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීම.

III වන අදියර

BOT ගිවිසුමේ දිනයේ සිට ආරම්භව මාස හැටක (60) කාලසීමාවක් ඇතුළත BOT ගිවිසුමේ නිශ්චිතව දක්වා ඇති පර්යන්තය සම්පූර්ණ කර මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීම.

(3) ව්‍යාපෘතියේ අපේක්ෂිත ආයෝජනය එ.ජ.ඩො. මිලියන 650 ක් වන බවත් 70:30 වන ණය හිමිකම් අනුපාතිකය මත මූල්‍ය සම්පාදනය කර ගැනීමට අපේක්ෂා කරන බවත් සම්පූර්ණ ණය ප්‍රමාණය විදේශ ණයක් මගින් සපයා ගැනීමට අපේක්ෂා කරනු ලබන බවත් ප්‍රකාශ කර ඇත.

(4) ඉහත කී ව්‍යාපෘතියේ කාර්යය සඳහා, සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත ප්‍රකාරව මෙම නිවේදනයෙහි උපලේඛනයේ සඳහන් කර ඇති බදු නිදහස් කිරීම් ව්‍යාපෘති සමාගම සඳහා සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (මෙහි මින්මතු ''BOI'' යනුවෙන් සඳහන් කරනු ලබන) විසින් අනුමත කරනු ලබන පරිදි ව්‍යාපෘති සමාගමේ කොන්ත්‍රාත්කරුවන් සඳහා සහ උපකොන්ත්‍රාත්කරුවන් සඳහා අදාළ විය යුතු බවට නිශ්චිතව දක්වා ඇත.

**උපලේඛනය**

**1. 2007 අංක 24 දරන දේශීය ආදායම් පනත**

(i) එකී ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් තුළින් උපචිතවන ලාභ සහ ඉපයීම් මත ව්‍යාපෘති සමාගම සඳහා ආදායම් බදු පැනවීමට අදාළ 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන (''බදු ගෙවීමෙන් නිදහස් කාලසීමාව'' යනුවෙන් හඳුන්වනු ලබන) අවුරුදු විසි පහක (25) කාලසීමාවක් සඳහා අදළ නොවිය යුතු ය.

එකී බදු ගෙවීමෙන් නිදහස් කාලසීමාව, ව්‍යාපෘති සමාගම විසින් බදු අයකළ හැකි ලාභ ඉපයීම සිදුකරනු ලබන පළමු වර්ෂයේ සිට හෝ ව්‍යාපෘති සමාගම විසින් ස්වකීය වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමෙන් පසුව එළඹෙන අවුරුදු දෙකක (02) කාලසීමාවක සිට යන අවස්ථා දෙකෙන් කලින් එළඹෙන අවස්ථාවේ සිට ආරම්භ විය යුතු ය.

එසේ වුව ද, ඉහත කී බදු ගෙවීමෙන් නිදහස් කාලසීමාව අවසන්වීමෙන් පසුව, තත්කාලයේ බල පවත්නා දේශීය ආදායම් පනතේ විධිවිධාන ප්‍රකාරව ව්‍යාපෘති සමාගමේ ලාභ, ඉපැයීම් සහ ආදායම් සම්බන්ධ ආදායම් බද්ද ගෙවනු ලැබිය යුතු ය.

(ii) බදු නිදහස් ලාභ සහ ඉපයීම් තුළින් කොටස් හිමියන් වෙත බෙද හරිනු ලබන සහ ඔවුන් විසින් ලබාගන්නා ලාභාංශ, ඉහත කී අවුරුදු විසි පහක (25) බදු ගෙවීමෙන් නිදහස් කාලසීමාව තුළ දී සහ ඉන්පසුව අවුරුද්දක (01) කාලසීමාවක් සඳහා ආදායම් බදු ගෙවීමෙන් නිදහස් වන්නේ ය.

(iii) අ. ප්‍රාග්ධන වියදම් සඳහා ලබාගන්නා විදේශ ණය මත වූ පොළිය මත;
ආ. ව්‍යාපෘතියේ සේවයේ නියුක්ත උපදේශකරුවන් සඳහා ගෙවනු ලබන තාක්ෂණික ගාස්තු මත;
රඳවා ගැනීමේ බදු ගෙවීමෙන් ව්‍යාපෘති සමාගම නිදහස් වන්නේ ය.

(iv) ඉහත කී ව්‍යාපෘතිය සම්බන්ධයෙන් සේවා නියුක්තියෙන් ලැබෙන ඉපයීම් සහ ලාභය මත අවුරුදු පහක (05) කාලසීමාවක් සඳහා ආදායම් බදු ගෙවීමෙන් උපරිම වශයෙන් විදේශීය සේවා නියුක්තිකයන් විසි (20) දෙනෙකුට යටත්ව ව්‍යාපෘති සමාගමේ විදේශීය සේවා නියුක්තිකයන් නිදහස් වන්නේ ය.

**2. 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත (VAT බදු පනත)**

BOI විසින් අනුමත කරනු ලබන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍යවන ව්‍යාපෘතිය ආශ්‍රිත සියලුම ආනයන භාණ්ඩ, BOT ගිවිසුමේ සඳහන් දින සිට ආරම්භව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අවුරුදු පහක (05) කාලසීමාව තුළදී, එකතු කළ අගය මත බදු (VAT බදු) ගෙවීමෙන් නිදහස් වන්නේ ය.

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන කාලසීමාව තුළ දී සිදුකරනු ලබන ව්‍යාපෘතිය ආශ්‍රිත භාණ්ඩ හෝ සේවා දේශීය වශයෙන් මිළදී ගැනීම් සඳහා වූ එකතු කළ අගය මත බදු විලම්භනය කරනු ලැබේ.

සපයනු ලබන සේවාවන් වැට් බදු පනතේ 7 වන වගන්තියේ 1 වන උප වගන්තියේ (ආ) හෝ (ඇ) ඡේදයන්හි සඳහන් විධිවිධානවලට අයත් වේ නම්, ඉන්පසුව වැට් බදු ගෙවීම ශුන්‍ය අගයක් ගනු ලබයි. ශුන්‍ය අගයන් ගනු ලබන සේවාවන් හැර, සෙසු සේවාවන් සාමාන්‍ය අනුපාතිකය යටතේ වැට් බදු ගෙවීමට යටත් වන්නේ ය.

3. **2011 අංක 18 දරන වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බදු පනත**

BOT ගිවිසුමේ දින සිට ආරම්භව අවුරුදු පහක (05) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන කාලසීමාව තුළදී ආනයනය කරනු ලබන BOI විසින් අනුමත කරනු ලබන ව්‍යාපෘතිය ආශ්‍රිත භාණ්ඩ මත, වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බදු (PAL) ගෙවීමෙන් සහ අයකිරීමෙන් ව්‍යාපෘති සමාගම නිදහස් වන්නේ ය.

4. **1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත**

BOT ගිවිසුමේ දින සිට අවුරුදු පහක (05) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාලසීමාව තුළ දී, BOI විසින් අනුමත කරනු ලබන ව්‍යාපෘතිය ආශ්‍රිත සියලුම ආනයන අයිතම, සෙස් බද්ද (CESS) ගෙවීමෙන් නිදහස් වන්නේ ය.

5. **රේගු ආඥාපනත (235 වන අධිකාරය)**

BOT ගිවිසුමේ දිනයේ සිට අවුරුදු පහක (05) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාලසීමාව තුළ දී, BOI විසින් අනුමත කරනු ලබන ව්‍යාපෘතිය ආශ්‍රිත සියලුම අයිතම ආනයනය කිරීම් සඳහා රේගු බදු ගෙවීමෙන් ව්‍යාපෘති සමාගම නිදහස් වන්නේ ය.

එසේ වුව ද, අසාදු ලේඛනයේ සඳහන් අයිතම ශ්‍රී ලංකාවේ සම්පූර්ණයෙන්ම නිෂ්පාදනය කරනු නොලබයි නම් හෝ එම අයිතම ප්‍රමාණවත් තත්ත්වයෙන්, ප්‍රමාණවලින් සහ ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීම සඳහා ලබාදී ඇති කාලසීමාව තුළදී ලබාගැනීමට නොමැති අවස්ථාවක දී, එම අසාදු ලේඛනයේ සඳහන් අයිතම ආනයනය කිරීම පිළිබඳව BOI විසින් සලකා බලනු ලැබිය යුතු ය.

**මහින්ද රාජපක්ෂ, පා. ම.**
ආර්ථික ප්‍රතිපත්ති සහ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍ය.

2021 ජූලි මස 30 වැනි දින,
ආර්ථික ප්‍රතිපත්ති සහ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ දී ය.

08-329

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.